**මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජන වැඩ සටහන - 2 කොටස 2019**

---

මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජන වැඩ සටහනේ - 2 කොටසේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2014 ජූනි 03 දින එළඹි අංක 3030 දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහනේ කාලය

ණය ගිවිසුමට අනුව, එවකට පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය වර්තමානයේ රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර කොළඹ මහනගර සභාව සහ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මහ කොළඹ ප්‍රදේශයේ ජල සම්පාදන හා අපජලය සේවා වැඩිදියුණු කිරීම හා කළමනාකරණය කිරීම සහ මහ කොළඹ ප්‍රදේශයේ ජල සම්පාදනය හා අපජල සේවා පිළිබඳ කාර්යක්ෂමතාවය හා මූල්‍ය තිරසාරත්වය වැඩිදියුණු කිරීම වැඩසටහනේ අරමුණු වේ. ණය ගිවිසුම ප්‍රකාරව වැඩ සටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 1,230.60 කට සමාන එජඩො මිලියන 9.44 ක් වන අතර ඉන් රු.මිලියන 1,042.88 කට සමාන එජඩො මිලියන 08 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යයනය කිරීමට එකඟවී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 187.22 කට සමාන එජඩො මිලියන 1.44 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට අපේක්ෂා කෙරේ. වැඩසටහන එහි කාර්යයන් 2014 සැප්තැම්බර් 23 දින ආරම්භ කරන ලද අතර 2019 ජූනි 30 වන විට නිම කිරීමට සැලසුම් තිබුණි. කෙසේවෙතත්, වැඩසටහනේ කටයුතු අවසන් කිරීමේ දිනය 2020 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි.

### 1.3 මතය

වැඩසටහනේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

වැඩසටහනේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | බලපෑම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 6 (01) (අ) වගන්තිය | පිරිවැය රු.මිලියන 5 හෝ ඊට වැඩි කොන්ත්‍රාත් පිළිගත් කොන්ත්‍රාත්කරුවන් විසින් කොන්ත්‍රාත්තුව අත්සන් කිරීමෙන් පසු දින 60 ක් ඇතුළත පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි විය යුතුය. තවද කොන්ත්‍රාත් ගිවිසුම පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි කළ යුතුය. කෙසේවෙතත්, සිවිල් ඉදිකිරීම් සහ සැපයුම් කොන්ත්‍රාත් හා සම්බන්ධ කොන්ත්‍රාත්කරුවන් මෙම අවශ්‍යතාවයන්ට අනුකූල වී නොතිබුණි. | නීතිමය සහ බදු සම්බන්ධ ගැටළු මත කොන්ත්‍රාත්කරුවන්ට එරෙහිව පියවර ගැනීමට නොහැකි වේ. | නීතිමය අවශ්‍යතාවන් සමඟ අනුකූලවීමට කොන්ත්‍රාත්කරුවන්ට දැනුම්දීමට පියවර ගෙන තිබුණි. | මෙම අවශ්‍යතාවන් සමඟ අනුකූලවීමට කොන්ත්‍රාත්කරුවන්ට පෙළඹවීමට පියවර ගැනීමට අවශ්‍ය වේ. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 වැඩසටහනේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

වැඩසටහනේ 3 කොටස යටතේ අපජල කළමණාකරනයේ ආයෝජනය සඳහා විස්තරාත්මක සැලැස්ම සහ ලංසු ලියවිලි සකස් කිරීම හා අනුමත කිරීම සහ කොළඹ නගරයේ මලාපවහන ජාලයේ තත්ත්ව පරික්ෂාව සිදුකිරීම, කිලෝමීටර් 125ක් පිරිසිදු කිරීම වැඩසටහනට අදාල කටයුතු වේ. කෙසේවෙතත්, වැඩසටහනේ කටයුතු ආරම්භයේ සිට වැඩසටහන සඳහා විස්තරාත්මක ක්‍රියාත්මක කිරීමේ සැලසුමක් නොතිබුණි. ලැබී තිබුණු තොරතුරු අනුව වැඩසටහනේ කටයුතු ආරම්භයේ සිට වර්ෂ 5 කට පසු 2019 දෙසැම්බර් 31 දිනට ණය නියෝජිතායතනය මඟින් සපයන ලද රු.මිලියන 1,042.88 කට සමාන එජඩො මිලියන 8.00 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 282.87 කට සමාන එ.ජ.ඩො. මිලියන 1.70 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | සංරචකය | විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | උපදේශන සේවා | උපදේශන කොන්ත්‍රාත්තුව 2016 අප්‍රේල් මස 25 දින ආරම්භ කර 2020 අප්‍රේල් මස 25 දින වනවිට අවසන් කිරීමට සැලසුම් කර තිබුණද කොන්ත්‍රාත්තුව 2019 දෙසැම්බර් 31 දිනට සියයට 33ක භෞතික ප්‍රගතියක් පමණක් අත්කරගෙන තිබුණි. | වැඩ සටහනේ අපේක්ෂිත අරමුණු වැඩසටහනේ කාල පරිච්ජේදය තුළදී අත්කරගත නොහැකි වේ. | වර්තමානයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා නැවත ලංසු කැදවීම සිදුකරමින් සිටින අතර කොන්ත්‍රාතුවේ කාලපරච්ඡේදය දීර්ඝ කිරීමට අවශ්‍ය පියවර ගනිමින් සිටී. | වැඩ සටහනේ කාලපරිච්ජේදය අවසන් වීමට පෙර වැඩ සටහනේ කටයුතු අවසන් කිරීමට කඩිනම් පියවර ගැනීමට අවශ්‍ය වේ. |
| (ආ) | තත්ත්ව පරීක්ෂාව සිදුකිරීම, සීසීටීවී සමීක්ෂණයක් සිදුකිරීම සහ මලාපවහන නාලිකා පිරිසිදු කිරීම. | සීසීටීවී තාක්ෂණය භාවිතයෙන් අප ජල පිරිසිදු කිරීමේ සමීක්ෂණය සහ කිලෝමීටර් 108 ක අප ජල නාලිකා පිළිබඳ දත්ත පද්ධතියක් පිළියෙල කිරීම 2016 ජුලි 01 දින ආරම්භ කිරීමට සැලැසුම් කර තිබුණි. කෙසේ වෙතත්, ඒ සඳහා වන කොන්ත්‍රාත්තුව 2019 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රදානය කර නොතිබුණි. | -එම- | දෙවතාවක් ලංසු කැදවා ඇති අතර අවස්ථා දෙකේදීම සුදුසුකම් ලත් ලංසු කරුවෙකු තෝරා ගැනීමට නොහැකි විය. තාක්ෂණික අවශයතාවයන් අඩුකර වැඩි ප්‍රසිද්ධියක් ලබා දී තුන්වන ලංසු කැදවීම සිදු කරමින් පවතී. | -එම- |

### 3.2 පාරිසරික කරුණු සම්බන්ධයෙන් ගැටළු

| විගණන ගැටළු | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| 2018 ඔක්තෝබර් 22 දින සිට බලපැවැත්වෙන පරිදි ව්‍යාපෘතියේ පරිසර නිලධාරියා ඉවත්ව තිබුණි. ණය ගිවිසුමේ 5 වන උපලේඛනය | වැඩසටහනේ කටයුතු පිළිබඳව පාරිසරක තක්සේරු නිරන්තරයෙන් සිදුකිරීමට නොහැකි වේ. | ව්‍යාපෘතියේ 2 වන කොටස සඳහා පරිසර නිලධාරියෙකු සඳහා නියමිත තනතුරක් නොමැත. ව්‍යාපෘතියේ පාරිසරික කටයුතු උපදේශක සමග ව්‍යාපෘති කළමණාකරන ඒකකයේ පරිසර නිලධාරියා | පරිසර නිලධාරියකු බඳවා ගැනීම සඳහා පියවර ගැනීම අවශ්‍ය වේ. |

| | |
|---|---|
| අනුව, වැඩසටහනේ පාරිසරික කාර්ය සාධනය නිරන්තරයෙන් නියාමනය කළ යුතු අතර ඒ පිළිබඳ වාර්තා ණය නියෝජිතායතනය වෙත අර්ධ වාර්ෂිකව ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, පාරිසරික නියාමන වාර්තා සහ සමාජ ආරක්ෂණ නියාමන වාර්තා සකස් කර ඉදිරිපත් කර නොතිබුණි. | විසින් සිදු කරනු ලබයි. |

**3.3 මානව සම්පත් කළමනාකරණයට අදාල ගැටළු**

| | කාර්ය මණ්ඩල තනතුරු | 2019 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල තත්ත්වය | | | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|---|
| | | අනුමත | තත්‍ය | පුරප්පාඩු සංඛ්‍යාව | | | |
| 01. | නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂක (ඉංජිනේරු) | 02 | 01 | 01 | බදවා නොගත් පුරප්පාඩු 12 හේතුවෙන් වැඩ සටහනේ කටයුතු වල සුමට ක්‍රියාකාරිත්වයට බලපානු ඇත. | උපලේඛණයේ දක්වා ඇති පරිදි සෑම ව්‍යාපෘතියක් සඳහාම වෙනම කාර්යමණ්ඩලයක් නොමැත. ව්‍යාපෘතියේ සියළුම කටයුතු මහ කොළඹ ජලය සහ අපජල කළමණාකරන වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩ සටහන සහ මහ කොළඹ අපජල කළමණාකරන ව්‍යාපෘතියට අනුයුක්ත කාර්යමණ්ඩලය විසින් සිදුකරනු ලබයි. | ප්‍රධාන තනතුරු පුරප්පාඩු 12ක් පිරවීමට කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |
| 02. | ව්‍යාපෘති ඉංජිනේරු (ප්‍රසම්පාදන) | 01 | - | 01 | | | |
| 03. | ව්‍යාපෘති ඉංජිනේරු | 10 | 07 | 03 | | | |
| 04. | පරිසර නිලධාරි | 01 | - | 01 | | | |
| 05. | ව්‍යාපෘති ලේකම් -1 | 02 | 01 | 01 | | | |
| 06. | සහකාර ව්‍යාපෘති ඉංජිනේරු-II | 07 | 05 | 02 | | | |
| 07. | කළමණාකාර සහකාර -II | 05 | 03 | 02 | | | |
| 08. | ඉදිකිරීම් කළමණාකරු | 2 | 01 | 01 | | | |
| | | **30** | **18** | **12** | | | |